1990 අංක: 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරනු ලබන මුද්දර ගාස්තු බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට පැවරීම පිණිස සලස්වා ඇති ප්‍රඥප්තියකි.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය**

1. මෙ ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ ........1992........ අංක: ....05.... දරන මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මුද්දර ගාස්තු පැවරීම**

2. 1990 අංක: 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය හා 1991 අංක: 05 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යටතේ පළාත් සභා විසින් පනවා අයකරනු ලැබ බස්නාහිර පළාතේ පළාත් සභාවේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාව තුළ පිහිටි යම් නිශ්චල දේපළ පැවරීමක් සඳහා අයකරනු ලැබූ යම් මුද්දර ගාස්තුව එම අයකරනු ලැබූ මුද්දර ගාස්තුවට අදාළ නිශ්චල දේපළ පිහිටි බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට, එම පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරි විසින් පූර්වෝක්ත පරිදි මුද්දර ගාස්තු අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ දෙකක් ඇතුළත බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත කරනු ලබන ලිඛිත හිමිකම් පෑමක් මත එම මුද්දර ගාස්තු ප්‍රමාණය පළාත් සභාව මගින් පවරා දිය හැකිය.

**රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ සහතිකය**

3. රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ ඔහු වෙනුවෙන් මෙම කාර්යය සඳහා ඔහු විසින් නම් කරනු ලැබූ යම් වෙනත් නිලධාරියකු විසින් සහතික කරන ලද මුද්දර ගාස්තු ගෙවීමට අදාළ ලේඛනයක් සමග හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත්නම් මිස 2 වැනි වගන්තිය යටතේ හිමිකම් පෑම වලංගු නොවේ.

**අර්ථනිරූපනය**

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙ ප්‍රඥප්තියේ "ප්‍රධාන පරිපාලන නිලධාරියා" යන්නෙන්

(අ) මහා නගර සභා සම්බන්ධයෙන් මහා නගර සභා කොමසාරිස්වරයාද,

(ආ) නගර සභා හා ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් ලේකම්වරයාද වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක් ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ

"සාධන පත්‍රය" 1990 අංක: 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ දී ඇති අර්ථයම ඇත්තේය.

"පළාත් සභා" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය

5. මෙ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.